# දැන්වීමයි

## දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම - 2026

දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව වීමට නියමිත පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අදාළ සියලු විස්තර හා ආදර්ශ අයදුම්පත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ (www.psc.sp.gov.lk) පළකර ඇත. ඒ සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2026.09.28** දින වේ.

**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**දකුණු පළාත.**

# දැන්වීමයි

## දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
### පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම - 2026

දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වීමට නියමිත පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා පත්කිරීමට, දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි නියුතු ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ සුදුසුකම්ලත් නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

2006.01.01 දින සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය හා එයට වරින්වර කරන ලද සංශෝධන අනුව ගන්නා ලද කොන්දේසි මෙම බඳවා ගැනීම සඳහා බලපවත්වනු ලැබේ.

- **පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (පුරප්පාඩු 01)**

02. <u>**මූලික සුදුසුකම්**</u>

ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

සහ

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 06/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

03. <u>**බඳවා ගැනීමේ ක්‍රමය**</u> - දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී, ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

04. මෙම තනතුර සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය ද, මෙම තනතුර සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් වන අවසාන තීරණය ද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේ ය.

05. **අයදුම්පත් එවිය යුතු ආකාරය :**

- මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අයදුම්කරුවන් විසින් සකස් කරනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානීන් වෙත ඉදිරිපත් කළ යුතු වේ. ආයතන ප්‍රධානීන් විසින් තමන්ට ලැබෙන අයදුම්පත් වල සඳහන් කරුණු අදාළ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු වල ඇතුළත් වාර්තා සමඟ සසඳා බලා නිරවද්‍යතාවය පිළිබඳ සෑහීමකට පත් වීමෙන් අනතුරුව සහතික කළ යුතුය.

- සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර **2026.09.28** වැනි දින හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මඟින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් ගේ නිර්දේශ සහිතව) අයදුම්පතේ අවසානයේ සඳහන් වන නිර්දේශය ද සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ අදාළ ලේඛන **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, 6 වන මහල, ගාල්ල"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දිය යුතුය.

- අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ "**දකුණු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම**" යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාර ගනු නොලැබේ

**සී.පී.රාජකරුණා**
ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

**සී.පී. රාජකරුණා**
**ලේකම්**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**දකුණු පළාත**